# කැලණිය අධ්‍යාපන කලාපය

අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2016 11 ශ්‍රේණිය

## පෙරදිග සංගීතය - I

නම : ........................................................................... කාලය : පැය 3

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1. රාගධාරී මධ්‍යලය ගීතයක් ගැයීමේ සැලකිලිමත් විය යුතු සුවිශේෂී කරුණකි.
   1. නියමිත ශ්‍රැති මත පිහිටා ගායනා කිරීමය
   2. වාදනය කරමින් ගායනය කිරීම
   3. තාල තබමින් ගායනය කිරීම
   4. ශ්‍රව්‍ය උපකරණ ආධාරයෙන් ගායනය කිරීම

2. නිර්දේශිත රාග අතර යමන් රාගයට අදාල ලක්ෂණයකි.
   1. විකෘති ස්වර නොයෙදේ
   2. ග, නි ස්වර විවාදි ස්වර වේ.
   3. ග, නි ස්වර කෝමල වේ.
   4. එක් විකෘති ස්වරයක් යෙදේ.

3. භූපාලි රාගයේ ස්වර කොටසකි.
   1. ග ප, ම ග, ම රි ස
   2. ස රි ග, ම රි, ස රි ස
   3. ස රි ග ප, ධ ප ම ග
   4. ග ප ධ ස්, ධ ප ග

4. කාෆි රාගයට සුදුසු තානාලංකාරයකි
   1. නි රි ග රි නි රි ස - නි ධ නි රි ග රි ස -
   2. ස රි ග ප ධ ප ග ප ස් ස් ධ ප ග රි ස -
   3. නි ස ග ම ප ධ ප ම ග ම ප ම ග රි ස -
   4. ස රි ග ම ග රි ස - රි ග රි ම ග රි ස -

5. තාල ස්ථනා 4කි. ආවර්ත දෙකක් තුල යොදන මාත්‍රා සංඛ්‍යාව 32 කි. මෙම හින්දුස්ථානි තාලය
   1. දීප්චන්ද් තාලය
   2. දදරා තාලය
   3. ත්‍රි තාලය
   4. ජප් තාලය

6. මාත්‍රා 2 බැගින් විභාගවන ගීතයකට ගැලපෙන තාලයකි.
   1. දීප්චන්ද් තාලය
   2. බෙම්ටෝ තාලය
   3. දදරා තාලය
   4. කෙහෙර්වා තාලය

7. ධහෙනති නකධින යන ඨේකාව වාදනයේදී බලිස්ථානය මත පිහිටන අවනද්ධ අක්ෂරය වන්නේ,
   1. ධ
   2. ති
   3. න
   4. ධි

8. තිත් දෙකකට ගැයෙන වන්නමකි
   1. උකුසා වන්නම
   2. තිසරා වන්නම
   3. නෛඅඩි වන්නම
   4. කෝකිල වන්නම

9. මෙම වන්නම් ප්‍රභේදය නාමිකව 24 කි. භාවිතයේ 18ක් පවතී.,
1. උඩරට වන්නම් 2. පහතරට වන්නම් 3. සබරගමු වන්නම් 4. දේශීය වන්නම්

10. කළුවානේ ධර්මාලංකාර අතපත්තු මුදලි විසින් රචිත බව කියවෙන වන්නමක එන ගී පදයකි.
1. කොහොවි යකා හඬ නගනා 2. සේවිත පාද සරෝරුහ
3. වරමති සුභ චරිතේ 4. මෝරා බීජයෙනා

11. පහතරට වන්නමක ලක්ෂණ අතරින් අදාළ නොවන ලක්ෂණයකි.
1. උපුල්වන් දෙවිඳු මුල්වීම
2. තාලයක් හා වෘත්තයක් මත නම් කිරීම
3. තානම, කවිය, ඉරට්ටිය යන කොටස්වලින් යුක්තවීම
4. කලාසම, අඩව්ව, යන කොටස් වලින් යුක්තවීම

12. සුවඳ සබන් ඇඟ ගාලා ... යන නාට්‍ය ඇතුළත් වත්මන් නාට්‍ය වන්නේ,
1. අන්දරේලා 2. රතු හැට්ටකාරී 3. රාජ කපුරු 4. මධුර ජවනිකා


13. විරිදු නාදමාලාවක් යොදගනිමින් තනු නිර්මාණය වී ඇති නව නාට්‍ය ගීයකි
1. සෝබාව දේ 2. යස ඉසුරු
3. පළමුව මම වැන්ද බුදුන් 4. රතදර සිරිපරදන

14. ප්‍රාග්, ජුපිටර් .... වැනි සම්භාව්‍ය සංධ්වනි නිර්මාණය කළ යුරෝපීය සංගීතඥයා
1. මෝසාර්ට් 2. බීතෝවන් 3. බාක් 4. යානි

15. බටහිර සංගීත සංධ්වනියක යොදගන්නා වයලීන පවුලට අයත් සංගීත භාණ්ඩයකි
1. ඩබල් බේස් 2. ගිටාර් 3. පියානෝව 4. මැන්ඩලීනය

16. නූතන ලෝකයේ Symphony Orchetra සඳහා ප්‍රචලිත සංගීතඥයෙකි
1. රහුමාන් 2. වී.ජී. ජෝර්ග් 3. යානි 4. මෝසාර්ට්

17. ස+ග+ප සහ ස+ග+ප යන කෝඩ්ස් දෙක පිළිවෙලින් හඳුන්වන්නේ,
1. C Major - C minor 2. C minor - C Major
3. E Major - E minor 4. G minor - G Major

18.



මෙම ගිටාරයේ ඇඟිලි පුවරුව මත සටහන් වී ඇති ස්වර ස්ථාන එකවර වැයීමෙන් නිපදවෙන chord එක වන්නේ,

1. C Major
2. C minor
3. G Major
4. G minor

19. මේජර් කෝඩ්ස් නිර්මාණය කර ගැනීමේදී ස්වර 12 තුළ ආරම්භක ස්වරය 1 ලෙස ගත් කළ ඉතිරි ස්වර වලට හිමි අංක වන්නේ,

1. 3+5 2. 5+8 3. 4+8 4. 10+12

20. සප්තකයේ ස්වර දොළස තුළ අර්ධ ස්වර (semitone) පිහිටන ස්වර දෙක

1. ස - රි 2. ම - ප 3. ප -ධ 4. රි - ග

21. ස්වර සුසංයෝගයේදී (Harmony) ඕනෑම ස්වරයක සිට තුන්වන ස්වරය Harmony වේ. Melody සුසංගත වන ස්වර ඛණ්ඩය වන්නේ,

1. ස ස ස රි/ ග - - - /
  නි̣ නි̣ නි̣ ස/ රි - - -

2. ස ස ස රි/ ග - - - /
 ග ග ග ම/ ප - - - /

3. ස ස ස රි/ ග - - - /
 ම ම ම ප/ ධ - - - /

4. ස ස ස රි/ ග - - - /
 රි රි රි ග/ ම - - - /

22. බටහිර සංගීත ප්‍රස්ථාරයක 3/4 , 4/8 , 6/8 , ආදී වශයෙන් දක්වෙන්නේ,

1. Key signature 2. Time signature 3. Accidental 4. Tie

23. නාඩගම් නාට්‍ය ශෛලියේ සංගීතමය ලක්ෂණයකි.

1. ස්ථායි අන්තරා ගීත ආකෘතිය
2. හින්දුස්ථානි සංගීත ආභාෂය
3. පසන්, තිර්ලානා, වඩිමුඩි වැනි තාල
4. සර්පිනාව තබ්ලාව භාවිතය

24. නාඩගම් ගීයක අලංකාරය පිණිස ද්‍රැතලයෙන් ගැයෙන කොටසකි.

1. දෙහොරාව 2. ඉන්නිසය 3. තෝඩායම 4. උරුට්ටුව

25. නුර්ති සඳහා සංගීතය සැපයූ ඉන්දියානු සංගීතඥයෙකි.

1. විශ්වනාත් ලව්ජි 2. අගලනායිදු 3. ගණිතාලංකාර 4. ශකීර් හුසේන්

26. සවන්දී පෙර රාම චරිතේ අසව්... යන නුර්ති ගීතය සඳහා පාදක වූ රාගය සහ රාග සංගති නිවැරදිව යෙදෙන්නේ

1. ගරි,ගප,ධනිස්රි - බිලාවල්
2. සනි̣සරිගම - භෛරවී
3. ප̣සස-රිගප - කාෆි
4. ගපධසධපගරි - බිලවල්

27. පැරණි නුර්ති කීපයක නාමාවලිය නිවැරදි වරණය තෝරන්න.

1. රොලීනා, ඉයුජින්, සඳකිඳුරු
2. හේමමාලි, විධුර. පද්මාවතී
3. ඇහැලේපොල, බැලසන්ත, සිංහවල්ලි
4. ශ්‍රී වික්‍රම, දුටුගැමුණු, බැලසන්ත

28. වෙස්සන්තර කාව්‍යයේ එන වැලපුම් ගී නාද රටාව අනුසාරයෙන් නිර්මිත මව් ගුණ ඇතුළත් සරල ගීයකි.

1. ආදරයේ උල්පත වූ අම්මා
2. විශාඛාව මා ඔබ දුටු බුදු සිරිතේ
3. කඳුළු හෙළා නැඹිලියට
4. සොම්නස හෝ සන්තාපය හමුවේ

29. කවියක් ගීතයක් බවට පත් කළ අවස්ථාවක් සඳහා නිදර්ශනයකි.

1. තෙල් ගාලා හිස පීරන් නැනෝ
2. සසර වසන තුරු
3. මල්සරා බැල්ම හෙළා
4. ආදරයේ උල්පත වූ අම්මා

30. තාරතාවය, විපුලතාවය, ධ්වනි ගුණය යනු,
1. ත්‍රිවිධ ලයයි 2. නාදයේ ත්‍රිවිධ ගුණයි. 3.ත්‍රිවිධ සප්තකයයි 4.කම්පන වාර තුනකි.

31. ජලය අඩුවෙන් පිරවූ බෝතලයක් සහ ජලය වැඩියෙන් පිරවූ බෝතලයක් ගෙන පිඹීමේදී පහළ නාදයක් නිකුත් විය. ඊට හේතුව
1. සංඛ්‍යාතය අඩුවීම
2. සංඛ්‍යාතය වැඩිවීම
3. විපුලතාවය වැඩිවීම
4. විපුලතාවය අඩුවීම

32. වෙල් යායක ගොන් දෙන්නෙක් කකා වුණි. යන ගැමි ගීය සම්බන්ධ වැරදි ප්‍රකාශයකි.
1. අනාසාතාත්මක මෙහෙ ගීයකි.
2. ගැමි ගී ගණයට අයත් පැල් ගීයකි.
3. පද මැද සහ අග යති යෙදෙන ගැමි ගීයකි.
4. අනාසාතාත්මක ගොයම් ගීයකි

33. විවිධ විරිත් අනුව රචනා කර ඇති පැදි සහිත කාව්‍ය ග්‍රන්ථයක් සහ එහි කතුවරයා වන්නේ,
1. සුදෝ සුදු - කේයස්
2. සැළලිහිනි සංදේශය-තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
3. ගුත්තිල කාව්‍ය-වැත්තැවේ හිමි
4. පැරකුම්බා සිරිත - දෙවන පරාක්‍රමබාහු රජු

34. රිදී වලාව නම් ගීත පොතෙහි කතුවරයා වන්නේ,
1. ආනන්ද සමරකෝන්
2. සුනිල් ශාන්ත
3. සූර්ය ශංකර් මොල්ලිගොඩ
4. ඩබ්.ඩී. අමරදේව

35. ඩබ්.බී. මකුලොලුව ශූරීන් විසින් නිර්මිත ගීත නාටකයකි.
1. කරදිය 2. නල දමයන්ති 3. බෙරහඬ 4. දෙපානෝ

36. තෙදිනි විරාජ රුවිනි විරාජ යන සරල ගීතය සඳහා පාදක වූ සේ ගී විශේෂයකි
1. වන්නම් 2. ප්‍රශස්ති 3. හටන් ගී 4. සව්දම්

37. පර්ද සහිත තත් වාද්‍ය භාණ්ඩ යුගලයකි.
1. වයලීනය - වියොලව
2. සිතාරය - එස් රාජය
3. සිතාරය - තාම්පූරාව
4. ගිටාරය - වයලීනය

38. තබ්ලාව නිමවීමට පදනම් වූ අවනද්ධ භාණ්ඩය වන්නේ,
1. පක්වාජය 2. මෘදංගය 3. ඩෝලය 4. නක්කරා

39. විෂම ග්‍රහයෙන් ගැයෙන ගී පාදය වන්නේ,
1. පි න ව න/ දු වු ද න/සෑ - - -/ම - - -
2. /+ ස සු ර/ව ස න /තු රු/ - - -
3. දු ර/෧ ප නෙ න/තැ නි ත/ ලා - -/
4. /ලංකා - /ලංකා -/පෙම්බර /ලංකා -/

40. රාගධාරි ශිල්ප ක්‍රම ඇතුළත් කරමින් නිර්මාණය වී ඇති රාගාශ්‍රිත සරල ගීයකි
1. කළිඳු ගංගා දෙණියේ
2. තෙදිනි විරාජ
3. මගේ රටට දළද හිමි සරණයි
4. සසර වසන තුරු

**කැලණිය අධ්‍යාපන කලාපය**
**පෙරදිග සංගීතය II**
11 ශ්‍රේණිය
දෙවන වාර පරීක්ෂණය

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න

1.) කෙටි පිළිතුරු ලියන්න.
1. /1 2 3 /4 5 / 6 7 / මාත්‍රා විභාග වන නිර්දේශිත තාලය නම් කරන්න.
2. එම තාලයෙහි ඨේකාව ලියන්න
3. එම තාලයෙහි මුල් මාත්‍රාව මත පිහිටන තාල සංකේතය කුමක්ද?
4. ට්‍රෙබල් ක්ලෙෆ් මත පිහිටන බටහිර රේඛා මණ්ඩලය රේඛා 5 මත පිහිටන ස්වර 5 නම් කරන්න.
5. ශාස්ත්‍රීය ගායනයකදී ශ්‍රැති පවත්වා ගැනීමට හා ලය පවත්වා ගැනීමට යොදගන්නා ස්වර වාද්‍ය හා තාල වාද්‍ය භාණ්ඩ දෙකක් නම් කරන්න.
6. ආසාතාත්මක මෙහෙ ගීයක මුල් පාදයක් ලියන්න
7. සංගීත සංධ්වනියක යොදගන්නා සුෂිර වාද්‍ය භාණ්ඩ දෙකක් නම් කරන්න.
8. රාගධාරී මධ්‍යලය ගීයක ගීතය මෙන් දෙගුණයක වේගයෙන් ගායනා කෙරෙන ස්වර අලංකාර විශේෂය නම් කරන්න.
9. වයලීනය සුසර කරන ක්‍රම දෙකක් ලියන්න
10. බිලාවල් හා භූපාලි රාගයේ සම ලක්ෂණයක් ලියන්න
11. භෛරවි රාගයේ විවාදි ස්වර නම් කරන්න.
12. යමන් රාගය ආශ්‍රිත සරල ගීතයක් නම් කරන්න (ල: 1x12=12)

2.) 1. පහත දැක්වෙන ස්වර ප්‍රස්ථාර කොටස 3rd Harmony වශයෙන් ස්වර පාදය ලියා එම ස්වර සමූහයට ගැලපෙන කෝඩ්ස් රවුම තුළ යොදන්න.

○ ○ ○ ○ ○ ○

Melody / ස - රි - /ග - - -/ ම - ග - / රි - - - /
Harmony - / ----------/--------/-----------/-----------/

2. Melody ස්වර පාදය බටහිර රේඛා මණ්ඩල ප්‍රස්ථාරයක දක්වන්න (ල: 6)

3.) 1. පහත දැක්වෙන්නේ නිර්දේශිත රාගයන්ට අයත් මුඛ්‍යාංගයන් කීපයකි. ඒවා හඳුනාගනිමින් රාගය නම් කරන්න.
i. නි රි ග , රි ස , ප ම ග
ii. ග රි , ග ප , ධ නි ස
iii. ග රි ස ධ, ස රි ග, ප ග, ධ ප, ග රි ස
iv. ස රි ස , ධ නි ස රි ස

2. i හා ii රාගවල රාග විස්තර කරන්න
3. iii හා iv රාගවල සර්ගම් ගීතවල ස්ථායි කොටස් ලියන්න (ල: 12)

4.) 1. නාඩගම් හා නූර්ති සංගීතයේ සම විෂමතා 4ක් ලියන්න
2. සබරගමු වන්නම්සහ පහතරට වන්නම් වල ලක්ෂණ 4 බැගින් වගුගත කරන්න
(ල: 12)

5.) 1. අනාසාතාත්මක මෙහෙ ගියක් ලියන්න
2. එම ගීතය බිහිවීමට හේතු වූ සංස්කෘතික පසුබම පිළිබද විස්තරයක් කරන්න
3. සේ ගීයක මුල් පාද 2ක් ප්‍රස්ථාර කරන්න (ල: 12)

6.) පහත දක්වෙන වගුවේ සඳහන් වන සංගීතඥයින් සහ ඔවුනට විශේෂ වූ සංගීත භාණ්ඩය හෝ ගායන ශෛලිය යොදු වගුව සම්පූර්ණ කරන්න.

| සංගීතඥයා | විශේෂිත වූ ගායන ශෛලිය / සංගීත භාණ්ඩ |
|---|---|
| පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා | |
| පණ්ඩිත් රවිශංකර් | |
| පණ්ඩිත් ජග්ජිත්සිං | |
| පණ්ඩිත් ශකිර් හුසේන් | |
| පණ්ඩිත් අසිස් චන්ද්‍ර බැනර්ජි | |

2. ඉහත වගුවේ සඳහන් එක් සංගීත භාණ්ඩයක දළ රූපසටහනක් ඇඳ කොටස් 5 ක් නම් කරන්න. (ල: 12)